විද්‍යාලය :- තෙප්පනාව කුමාර මහා විද්‍යාලය

සිංහල භාෂාව හා සාහිත්‍යය :- 12 ශ්‍රේණිය පැවරුම්

පුරාතන ගද්‍ය සාහිත්‍යය :- මට්ටකුණ්ඩලී වස්තුව (සද්ධර්මරත්නාවලිය)

විෂය භාර ගුරු :- ඕ.එම්.එන්.කරුණාරත්න

**01.පහත ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න?**

ළදරුවාණෙනි,යම් සේ මහත් ව ඇවිලෙන ගින්නක් දැක සත්පුරුෂ කෙනෙක් මෙ ගිනි මෙ සේ ඇවිළ ඇවිළ තිබිලා ගම්වල ගෙවල වැද ගෙන ගම් ගෙවල් දවා පියා නමුත් බල බලා යාම තරම් නො වන්නේ වේදැයි පැනක් හිස නිවා පියත් ද එ පරිද්දෙන් තමාගේ **සන්තානයෙහි** දැරු ශෝක නැමැති ගින්න වැද ගෙන අදහස් නැමති ගම් ගෙවල් දවනුවා තෙපි තොපගේ අනුශාසනා නැමති පැනින් නිවා පුව.නැවත ශෝක නැමති **ශරයන්** විත් කාපු මා,තෙපි තොපගේ නුවණ නැමති අතින් සෙමෙන් සෙමෙන් ශෝක ශරය හරා පියා අනුශාසනා නැමති බෙහෙදන් අදහස් නැමති සැර පහරට බෙහෙත් කොට සුව කළහ. එ සේ හෙයින් තොපගේ මාලුකම පිහිටා මෙ වක් පටන් දරු සෝක නොකරමි.

1. ඉරි ඇඳි පද සඳහා අර්ථ විවරණ සපයන්න?
2. “අනුශාසනා නැමති පැනින් නිවා” යන්නෙහි ඇති කාව්‍යාලංකාරය කුමක්ද?
3. දරුවන් පිළිබඳ ශෝකය සමානකර ඇත්තේ කුමකටද?
4. කෙනෙක් යන පදයේ ව්‍යාකරණ විභාග දක්වන්න?